(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(3).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 දෙසැම්බර් 20 සිකුරාදා**

---

**2025 ජනවාරි 07 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

132/2024

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ පවතින වෛද්‍ය, හෙද සහ අතුරු වෛද්‍ය යන සේවාවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) පුත්තලම දිස්ත්‍රික්කයේ රෝහල් පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

145/2024

ගරු දේවානන්ද සුරවීර මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට මූල්‍ය කටයුතු සිදු කරනු ලබන සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) මහරගම සමූපකාර ග්‍රාමීය බැංකුව, ඒ යටතට අයත් වන්නේද;

(iii) මහරගම සමූපකාර සමිතියේ සභාපතිවරුන් හා අධ්‍යක්ෂක මණ්ඩලයේ අක්‍රමිකතා හේතුවෙන් තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ලබා ගැනීමට නොහැකි වී ඇති බව දන්නේද;

(iv) එම ගැටලුව නිරාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

146/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ක/රමුක්කන විද්‍යාලෝක ප්‍රාථමික විද්‍යාලය පිහිටි භූමියේ නවීන පහසුකම් සහිත නව පාසලක් ඉදිකිරීම සඳහා "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ පියවර ගන්නා ලද බව දන්නේද;

(ii) ඒ සඳහා මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම නව පාසල ඉදිකිරීමේ සැලැස්ම අනුව මේ වනවිට එහි ඉදිකිරීම්වල ප්‍රගතිය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ආරම්භ කරන ලද මහල් හතරකින් යුතු පාසල් ගොඩනැගිල්ලේ අඩක් පමණක් නිම කර මේ වනවිට එහි ඉදිකිරීම් නවතා දමා ඇති බව දන්නේද;

(ii) එම පාසලේ ක්‍රීඩාංගණයේ ගොඩගසා ඇති ගල් සහ අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමට ගනු ලබන පියවර කවරේද;

(iii) ඉහත පාසල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

173/2024

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 30 තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය කවරේද;

(ii) කෘෂිකර්ම ක්ෂේත්‍රය, කර්මාන්ත ක්ෂේත්‍රය සහ සේවා ක්ෂේත්‍රය යන ක්ෂේත්‍ර මත විශ්වාසය තබන මට්ටම පිළිබඳව නිශ්චිතව දක්වමින් ඉදිරි වසර 15 සඳහා ආර්ථික වර්ධන පුරෝකථනය කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) (i) සීඝ්‍ර සංවර්ධනය සඳහා රජය විසින් හඳුනාගෙන ඇති ප්‍රධාන ක්ෂේත්‍ර දහය කවරේද;

(ii) රජය දේශීය ආයෝජකයින් කෙරෙහි අවධානය යොමු කිරීමට සහ ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට අපේක්ෂා කරන මට්ටම කොපමණද යන්න සහ එහි ඉදිරි වසර දහය සඳහා පුරෝකථනය කරන ලද වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් සහ ඇමරිකානු ඩොලර්වලින් කොපමණද;

(iii) රජය විදේශීය ආයෝජකයින් කෙරෙහි අවධානය යොමු කිරීමට සහ ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට අපේක්ෂා කරන මට්ටම කොපමණද යන්න සහ එහි ඉදිරි වසර දහය සඳහා පුරෝකථනය කරන ලද වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් සහ ඇමරිකානු ඩොලර්වලින් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේනම් ඒ මන්ද?

181/2024

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ සිට මේ දක්වා නායයාම් හේතුවෙන් අවතැන් වූ පවුල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පවුල් අතරින් මේ වනවිටත් තාවකාලික නිවාසවල පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව සහ ඥාතීන්ගේ/හිතවතුන්ගේ නිවාසවල පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත පවුල්වලට මේ වනතෙක් විකල්ප නිවාස/ඉඩම් නොලැබීමට හේතුව කවරේද;

(iv) ඉහත ගැටලුව විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(v) ඉදිරියේදී මෙවැනි ව්‍යසන තත්ත්වවලදී අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

187/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සත්ත්ව ගොවිපළවල ඇති කරනු ලබන ඌරන් අතර පැතිර යන වසංගත රෝගයක් හේතුවෙන් ඌරන් මිය යමින් සිටින බවත්;

(ii) මේ හේතුවෙන් සුළු පරිමාණ මෙන්ම මහා පරිමාණ සත්ත්ව ගොවිපළවල් සම්පූර්ණයෙන්ම වසා දැමීමට සිදු වී ඇති බවත්;

(iii) එම රෝගය සඳහා නිශ්චිත එන්නතක් හෝ ඖෂධයක් නොමැති වීම හේතුවෙන් සතුන් මියයාමෙන් සත්ත්ව ගොවිපළ හිමිකරුවන්ට විශාල වශයෙන් පාඩු සිදු වී ඇති බවත්;

(iv) සිදු වී ඇති අලාභ/හානි වෙනුවෙන් ඔවුන්ට කිසිදු වන්දි මුදලක් හෝ සහනාධාරයක් නොගෙවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් රෝගය හේතුවෙන් මියයන සතුන් වෙනුවෙන් කිසියම් වන්දියක්/සහනාධාරයක් ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම වන්දි/සහනාධාර ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

236/2024

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය සැපයීම් ක්‍රියාවලියට සම්බන්ධ පාර්ශ්වයන් අතර සම්බන්ධීකරණයක් නොමැති වීම සහ නිසි පරිදි දත්ත පද්ධතිය නඩත්තු නොකිරීම හේතුවෙන් ඖෂධ හිඟයක් ඇති වී ඇති අතර ඖෂධ මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති බවත්;

(ii) එම තත්ත්වය සමස්ත සෞඛ්‍ය පද්ධතියේ පැවැත්මට අභියෝගයක් වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය සෞඛ්‍ය පද්ධතියේ ඖෂධ තොග කළමනාකරණය සම්බන්ධයෙන් පරිගණක මෘදුකාංග පද්ධතියක් තිබේද;

(ii) එසේ නම්, එය කවරේද;

(iii) එම පද්ධතිය අඛණ්ඩව යාවත්කාලීන කරන්නේද;

(iv) ඖෂධ මිලදී ගැනීමේ ක්‍රියාවලිය සහ තොග බෙදාහැරීමේ ක්‍රියාවලිය නිතිපතා අධීක්ෂණය කරන්නේද;

(v) එහි වගකීම දරන්නේ කවුරුන්ද;

(vi) මෙම සමස්ත ක්‍රියාවලිය තුළ හඳුනාගෙන ඇති අක්‍රමිකතා සහ දුර්වලතා කවරේද;

(vii) ඒවා වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

238/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ සහ පෞද්ගලික රෝහල්වල ඖෂධ, ශල්‍ය හා වෛද්‍ය උපකරණ, රසායනාගාර පරීක්ෂණ සඳහා අවශ්‍ය උපකරණ සහ ප්‍රතික්‍රියක එක්ස්-රේ ආදී විකිරණශීලී පරීක්ෂණ සඳහා අවශ්‍ය උපකරණ ආදියෙහි හිඟයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත (i)හි සඳහන් ඖෂධ හා උපකරණ අතරින් මේ වනවිට තිබෙන ඖෂධ හා උපකරණ සහ හිඟ ඖෂධ හා උපකරණ සම්බන්ධයෙන් වාර්තාවක් තිබේද;

(iii) 2025 වර්ෂය අවසානය දක්වා ඉහත සඳහන් ඖෂධ හා උපකරණ අඛණ්ඩව සැපයීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;

(iv) යම් ඖෂධයක් හෝ උපකරණයක් හිඟවීමට අවකාශ තිබේද;

(v) ඉහත ඖෂධ හෝ උපකරණ ලබා ගැනීමට හා ඒවා නොමැති වීමෙන් ඇති විය හැකි අවදානම මඟහරවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

242/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිරුළපන මංසන්ධිය හරහා ඉදිකිරීමට යෝජිත ගුවන් පාලම ඉදිකිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එය ඉදිකරනු ලබන කාල වකවානුව කවරේද;

(iii) ඒ සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගන්නේ දේශීය වශයෙන්ද නැතහොත් විදේශීය වශයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

251/2024

ගරු අජිත් ගිහාන් මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සිදු කරන ලද පාස්කු ප්‍රහාරය සම්බන්ධ වගඋත්තරකරුවන් මේ දක්වා නීතිය ඉදිරියට ගෙන ඒමට නොහැකි වී ඇති බවත්;

(ii) ඉහත ප්‍රහාරයට සම්බන්ධ මහ මොළකරුවන් ඇතුළු වගඋත්තරකරුවන් ඉතාම කඩනමින් නීතිය ඉදිරියට ගෙන ඒමට කටයුතු කරනු ඇති බවට කාදිනල් හිමිපාණන් ප්‍රමුඛ කතෝලික සභාව සහ අනෙකුත් ආගමික නායකයන් අපේක්ෂා කරන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත ප්‍රහාරයට සම්බන්ධ වගඋත්තරකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒමට කටයුතු කර ඉහත ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය හා සාධාරණය ඉටු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එවකට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 සැප්තැම්බර් 10 දිනැති අංක 2401/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.12.17 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2025 ජනවාරි 07 අඟහරුවාදා)**

128/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාබේරියතැන්න ඉදිකිරීමට යෝජිත අභ්‍යන්තර ගුවන්තොටුපළ සඳහා වෙන්කරගෙන ඇති/ අත්පත් කරගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතර ඇති රජයේ වැවිලි ඉඩම් ප්‍රමාණය සහ පෞද්ගලික වැවිලි ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි ඉඩම්වල ඇති පෞද්ගලික නිවාස, කර්මාන්තශාලා, වතු පාසල් සහ මහජන සේවා සපයන ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී පෞද්ගලික නිවාස අහිමිවන බවට හඳුනාගත් එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) නිවාස අහිමි වන පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණ සහ විකල්ප යෝජනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජනවාරි 08 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2024

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගය හා සම්බන්ධව ක්‍රියාත්මක කර ඇති විවිධ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා ලබා ගෙන ඇති දේශීය ණය මුදල, විදේශීය ණය මුදල, එම ණය සපයා ගන්නා ලද මූලාශ්‍රය, මේ දක්වා වැය කර ඇති මුදල හා මේ වනතෙක් භාවිතා කර නොමැති මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ව්‍යාපෘති සම්බන්ධයෙන් විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති කරුණු කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

59/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති සංස්ථා, සමාගම් ඇතුළු මුළු ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම, සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව සහ පැවරී ඇති කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකම කාර්යය ඉටු කරනු ලබන විවිධ ආයතන ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් පසුගිය කාලයේ ඉදිරිපත් කර තිබූ බව දන්නේද;

(iv) ඒ යෝජනාව සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

66/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තුව-උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නීති විරෝධී ලෙස ඉල්මනයිට් කැණීම් සිදු කරන බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට සෞඛ්‍ය, ජීවනෝපාය හා පානීය ජල ගැටලු ඇති විය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, නීති විරෝධීව සිදු කරන ඉල්මනයිට් කැණීම් කටයුතු තහනම් කිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

79/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වී අස්වැන්න එක් එක් කන්නය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වී අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගත් වී ප්‍රමාණය එක් එක් කන්නය අනුව ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) වී අලෙවි මණ්ඩලය උපයෝගී කරගනිමින් වී මිල පාලනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

261/2024

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ ඇති පළාත් සභාව සතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ, රෝහල් නොවන වෙනත් සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථාන/ආයතන පළාත් සභාව සතුව තිබේද;

(iii) එසේ නම්, එම මධ්‍යස්ථාන/ආයතන කවරේද;

(iv) කළුතර දිස්ත්‍රික්කයේ ඇති රේඛීය අමාත්‍යාංශය සතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(v) එම දිස්ත්‍රික්කයේ, රෝහල් නොවන වෙනත් සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථාන/ආයතන රේඛීය අමාත්‍යාංශය සතුව තිබේද;

(vi) එසේ නම්, එම මධ්‍යස්ථාන/ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(ii) හා (v)හි සඳහන් මධ්‍යස්ථාන/ආයතන තුළ බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර ඒකක පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජනවාරි 09 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

87/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය සතු ගුවන්විදුලි ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනයේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් ආයතනය ලැබූ ලාභ/අලාභ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සඳහන් ආයතන අලාභ නොලබන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

101/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.11.20 දින වනවිට ගෘහස්ථ සහ ව්‍යාපාරික යන එක් එක් පදනම යටතේ විදුලි ඒකකයක් සඳහා අය කරනු ලබන ගාස්තුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2024.10.21 දින සිට මේ දක්වා සිදු කර ඇති විදුලි ගාස්තු සංශෝධනවල විස්තර කවරේද;

(iii) එම සංශෝධන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ තීරණවලට/ අනුමතියට යටත්ව සිදු කර තිබේද;

(iv) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ලබා දෙන තීරණ පිළිගන්නේද;

(v) එම කොමිෂන් සභාව විසුරුවා හැරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුලිය සඳහා ස්ථාවර මිලක් පවත්වාගෙන යාමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම ස්ථාවර මිල කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

109/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන පෞද්ගලික විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම විදුලි බලාගාරවල නම් කවරේද;

(iii) එම එක් එක් බලාගාරයේ හිමිකරුගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම බලාගාර හිමිකරුවන්ට ගෙවා ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විදුලි බලාගාර හිමිකරුවන් සමඟ එළැඹ ඇති ගිවිසුම් ඉතා අහිතකර බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

133/2024

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ විභාග කරමින් පවතින අවුරුදු පහ ඉක්ම වූ සිවිල් නඩු සංඛ්‍යාව සහ අවුරුදු දහය ඉක්මවූ සිවිල් නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නඩු විභාග කර අවසන් කිරීමේදී පවතින ප්‍රමාදය වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

147/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ බණ්ඩාරගම ක/වෑවිට මෛත්‍රී මහා විද්‍යාලය සහ ක/කිදෙල්පිටිය ශ්‍රී සාරාලංකාර මහා විද්‍යාලය යන විද්‍යාලවල ඉදිකිරීම් ආරම්භ කරන ලද ශ්‍රවණාගාරය සහිත තෙමහල් ගොඩනැගිලි දෙකක් වැඩ අවසන් නොකර, අතහැර දමා ඇති බව දන්නේද;

(ii) එම එක් එක් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මේ වනවිට වැය කර ඇති මුදල සහ ඉදිකිරීම් නිම කිරීම සඳහා තවදුරටත් අවශ්‍ය මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉදිකිරීම් නිම කිරීම සඳහා අවශ්‍ය මුදල් සැපයීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

174/2024

ගරු රවී කරුණානායක මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 5 තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ශ්‍රම බලකාය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වසර 10 තුළ ස්ථිර සහ අනියම් රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වසර 10ක කාලය තුළ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා දීමනා සඳහා වූ මුළු මුල්‍ය පිරිවැය කවරේද;

(iv) පසුගිය වසර 10 තුළ ගෙවා ඇති මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය කොපමණද;

යන්න එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) (i) ඉදිරි වසර 10 සඳහා පුරෝකථනය කල හැකි ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ශ්‍රම බලකාය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉදිරි වසර 5 සඳහා බඳවා ගැනීමට අදහස් කරන රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉදිරි වසර 10 සඳහා අපේක්ෂිත විශ්‍රාම වැටුප් වියදම් කවරේද;

(iv) ඉදිරි වසර 10 සඳහා අපේක්ෂිත විශ්‍රාමිකයන් සංඛ්‍යාව කවරේද;

යන්නත් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

182/2024

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ සිට මේ දක්වා ජාතික විදුලිබල පද්ධතියට අලුතින් එකතු කරන ලද විදුලි බලාගාර සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එම එක් එක් විදුලි බලාගාරයෙන් ජනනය කිරීමට අපේක්ෂා කරන ලද විදුලි ධාරිතාවය සහ මේ වනවිට ජනනය කරනු ලබන විදුලි ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත විදුලි බලාගාර අතරින් පුනර්ජනනීය බලාගාර සංඛ්‍යාව කොපමණද;

(iv) එම බලාගාර කවරේද;

(v) එම එක් එක් විදුලි බලාගාරයෙන් ජනනය කරනු ලබන විදුලි ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරි වසර දෙක තුළදී ජාතික විදුලි පද්ධතිය වර්ධනය කිරීම සඳහා ඇති සැලසුම් කවරේද;

(ii) පුනර්ජනනීය බලශක්තිය වර්ධනය කිරීම සඳහා වන සැලසුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

237/2024

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොරියාවේ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා ලබා දෙන වීසා වර්ග කවරේද;

(ii) E8 වීසා යටතේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් කොරියානු රජයේ රැකියා සඳහා පිටත් කර යැවීමට පසුගිය රජය විසින් ගනු ලැබූ තීරණයේ පදනම කවරේද;

(iii) ඒ යටතේ කොරියානු රැකියා සඳහා පිටත්ව ගොස් ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ශ්‍රමිකයින් විපතට පත් වී ඇති බව දන්නේද;

(v) එසේ නම්, විපතට පත් වූ සංඛ්‍යාව කොපමණද;

(vi) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොරියානු රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් පිටත් කරනු ලබන්නේ E8 වීසා යටතේ පමණක්ද;

(ii) වෙනත් වීසා වර්ග තිබේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

239/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍යවරුන් සහ වෙනත් පුහුණු සෞඛ්‍ය වෘත්තිකයන් රට හැර ගිය බවත්;

(ii) එමඟින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවයට අහිතකර බලපෑමක් සිදු වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවයේ සේවය කරනු ලබන;

(ii) ඉදිරියේදී රජයේ සෞඛ්‍ය සේවයෙන් විධිමත් සේවාවක් සැපයීම සඳහා සිටිය යුතු;

(iii) වර්ෂ 2022 සිට 2024 නොවැම්බර් මස දක්වා, විශ්‍රාම ගැන්විය යුතු වයස සම්පූර්ණ නොවී සේවයෙන් ඉවත් වූ;

(iv) විශේෂඥ පුහුණුව ඇතුළු විවිධ අධ්‍යයන ආයතනවල මේ වනවිට පුහුණු වෙමින් සිටින;

විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍යවරුන්, හෙද නිලධාරීන්, පරිපූරක හා අතුරු වෛද්‍ය සේවා නිලධාරීන් සහ කණිෂ්ඨ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඔවුන් කඩිනමින් සෞඛ්‍ය සේවයට බඳවා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

247/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ‘COVID-19 වැළඳී ඇතැයි සැක කෙරෙන රෝගීන් සහ තහවුරු කරන ලද රෝගීන් පිළිබඳව වන තාවකාලික සායනික පුහුණු මාර්ගෝපදේශකය’ නමැති ප්‍රකාශනය පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රකාශනයට අන්තර්ගතය සහ නිර්දේශ මඟින් දායක වූ විශේෂඥයින්ගේ නම් කවරේද;

(iii) ඔවුන් විශේෂඥ සම්පත්දායකයින් ලෙස සේවය කරන අවස්ථාවේදී ඔවුන් අනුබද්ධිතව සිටි ආයතන සහ ඔවුන්ගේ තනතුරු නාම කවරේද;

(iv) ඔවුන් පත් කිරීම සඳහා වගකීම දැරූ බලධාරියා කවුරුන්ද;

(v) ඔවුන් තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ලද නිර්ණායක/පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ප්‍රකාශනයේ 7 වන ඡේදය පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එම ඡේදයේ අන්තර්ගතය සහ නිර්දේශ සඳහා වගකිව යුතු නිශ්චිත විශේෂඥ සම්පත්දායකයින්ගේ නම් කවරේද;

(iii) 7 වන ඡේදයේ අන්තර්ගතය සහ නිර්දේශ සකස් කිරීම සඳහා භාවිතා කරන ක්‍රියාවලිය, ලේඛන සහ ආශ්‍රේය ග්‍රන්ථ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 7 වන ඡේදයේ නිර්දේශ දේශීය හෝ ජාත්‍යන්තර වශයෙන් වෛද්‍ය ආචාර ධර්ම සහ වෛද්‍ය මානව විද්‍යාව යන ක්ෂේත්‍රවල විශේෂඥයින්ගේ වෘත්තීය මතයට භාජනය වී තිබේද;

යන්නත් එතුමා එම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජනවාරි 10 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4/2024

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ඇති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු මුළු රජයේ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ ආරක්ෂක සේවා සපයනු ලබන ආරක්ෂක සමාගම්වල නම් කවරේද;

(iii) ඒ අතරින් රජයේ සමාගම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් රජයේ ආයතනවල ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂක සේවා සමාගම්වලට ගෙවන ලද මුදල එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ ආයතනවලට ආරක්ෂාව සැපයීමට අදාළ කොන්ත්‍රාත් ලබා ගැනීමේදී වංචනික ක්‍රියා සිදු වන බව දන්නේද;

(ii) එසේ නම්, රජයේ ආයතනවලට ආරක්ෂක සේවා සැපයීම, රජය සතු ආරක්ෂක සමාගම්වලට ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

60/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ නීතිවේදී උපාධිය ප්‍රදානය කරනු ලබන රජයේ විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම විශ්වවිද්‍යාලවලින් නීතිවේදී උපාධිය සම්පූර්ණ කරන ලද උපාධිධාරීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වෙනත් විශ්වවිද්‍යාල කිහිපයකද නීති අධ්‍යයන අංශ ස්ථාපිත කර නීති අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

67/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තුව-උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වාකරේ ප්‍රදේශයේ ඉස්සන් වගාව සහ ධීවර කටයුතු මුවාවෙන් ඉඩම් අල්ලා ගැනීම් සිදු කරනු ලබන බවත්;

(ii) එසේම, ඒරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුලුට්ටුමානෝඩෙයි ප්‍රදේශයේ ද ඉඩම් අල්ලා ගැනීම් සිදු කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම ඉඩම් අල්ලාගැනීම් වැළැක්වීම සඳහා පියවර ගන්නේද;

(ii) එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

80/2024

ගරු රෝහණ බංඩාර මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති රට කවරේද;

(iii) එම එක් එක් කාර්යාලයේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවයට ඇතුළත් වීම සඳහා සපුරාලිය යුතු අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම සුදුසුකම් සපුරාලීමෙන් තොරව, මේ වනවිට විදේශ රටවල ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, සේවා ස්ථානය සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සේවකයන් නැවත ශ්‍රී ලංකාවට කැඳවා නිසි සුදුසුකම් සහිත සේවකයන් විදේශ රටවල ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවල සේවයට යැවීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

88/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා අලි-මිනිස් ගැටුම හේතුවෙන් මිය ගිය පුද්ගලයන් හා වනඅලින් සංඛ්‍යාව එක් එක් වර්ෂය සහ වනජීවී කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අලි-මිනිස් ගැටුම සඳහා ස්ථිර විසඳුමක් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

102/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට නාඩු සහල් සහ සම්බා සහල් කිලෝ ග්‍රෑම් එකක වෙළඳපළ මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සහල් මිල අඩු කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iii) සහල් සඳහා පාලන මිලක් හඳුන්වා දෙන්නේද;

(iv) එසේ නම්, එම මිල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරිභෝගිකයන් වෙත හිඟයකින් තොරව සහල් ලබා දීම සඳහා රජයේ මැදිහත්වීම මත සහල් සංචිත පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එම සංචිත ප්‍රමාණය කොපමණද;

(iii) සහල් ආනයනය කිරීම සම්බන්ධයෙන් වන වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

110/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපය තුළ මේ වනවිට ක්‍රියාත්මක වන කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්ත ශාලාවල නම් කවරේද;

(iii) එම කර්මාන්ත ශාලා වර්ගීකරණය කර ඇති ආකාරය කෙසේද;

(iv) එම එක් එක් කර්මාන්ත ශාලාව තුළින් උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) නව කර්මාන්ත ශාලා ආරම්භ කිරීමට ගිවිසුම් ගත වී ඇති ආයෝජකයන් සිටින්නේද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

243/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොළඹ දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති මහල් නිවාස ඒකක සංඛ්‍යාව එක් එක් මහල් නිවාස සංකීර්ණය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිවාස ඒකක අතරින් මේ දක්වා ඔප්පු ලබා දී ඇති නිවාස ඒකක සංඛ්‍යාව කොපමණද;

(iii) ඔප්පු ලබා නොදුන් නිවාස ඒකක සඳහා ඔප්පු ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

249/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මිය ගිය අයගේ ආදාහනය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය තීරණය, "විශේෂඥ කමිටුවක්" විසින් නොමඟ යවනු ලැබූ බවට දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2022.11.29 වන දින කරන ලද ප්‍රකාශය සමඟ එතුමා එකඟ වන්නේද;

(ii) ඉහත සඳහන් කරන ලද කමිටුව රජය විසින් පත් කරන ලද කමිටුවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) ඉහත සඳහන් කරන ලද කමිටුව රජය විසින් පත් කරන ලද කමිටුවක් නම්,

(i) විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මිය ගිය අයගේ මෘත දේහ බැහැර කිරීම සම්බන්ධයෙන් එහි නිර්දේශ කවරේද;

(ii) පත් කිරීමේ බලධාරියා කවරෙක් ද;

(iii) විෂය පථය සහ/හෝ බලතල කවරේ ද;

(iv) සාමාජිකයින්ගේ නම් සහ තනතුරු කවරේ ද;

(v) සභාපතිවරයාගේ නම කවරේද;

(vi) එය අවසන් වරට රැස්වූ දිනය කවරේද;

(vii) පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව කොපමණද;

(viii) රැස්වීම් පැවැත්වූ ස්ථානය කවරක්ද;

(ix) එක් එක් රැස්වීමෙහි සභාපතිත්වය දැරූ අයගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

252/2024

ගරු අජිත් ගිහාන් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උපයන කර්මාන්තයක් වන ඉස්සන් වගාව මේ වනවිට අර්බුදයකට ලක් වී ඇති බවත්;

(ii) පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවට එම කර්මාන්තය මඟින් විශාල ආර්ථිකමය ශක්තියක් ලැබුණ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) එම කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 1/2024

ගරු හේෂා විතානගේ මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂ ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම්වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිත කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 2/2024

ගරු හේෂා විතානගේ මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2024

ගරු හේෂා විතානගේ මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2024

ගරු හේෂා විතානගේ මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු හේෂා විතානගේ මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු හේෂා විතානගේ මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2024

ගරු හේෂා විතානගේ මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින්, රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු හේෂා විතානගේ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු හේෂා විතානගේ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු හේෂා විතානගේ මහතා,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්, හිටපු රාජ්‍ය නායකයන් හා එම වැන්දඹුවන් භුක්ති විඳින වරප්‍රසාද සුදුසු පරිදි කප්පාදු කිරීම,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්, හිටපු රාජ්‍ය නායකයන් හා එම වැන්දඹුවන් භුක්ති විඳින වරප්‍රසාද පිළිබඳව මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයන් හි මෙන්ම මෙරට ජන සමාජය තුළ කථිකාවක් ඇති වී තිබෙන හෙයින්, රටේ පොදු ජනතාවගේ ඉල්ලීමට සවන්දෙමින් ඔවුන්ගේ අපේක්ෂාවන් සඵල කිරීම පිණිස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට, හිටපු රාජ්‍ය

නායකයන්ට හා එම වැන්දඹුවන්ට විරාත් කාලයක් ලබා දී තිබූ වරප්‍රසාද සුදුසු පරිදි අඩු කිරීම, ඉවත් කිරීම හෝ ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරයන්ගෙන් සාධාරණ පිළිතුරක් පාර්ලිමේන්තු සභාව තුළ දී සාකච්ඡා කොට ලබා ගැනීමට රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— සමුපකාර සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාවලියට නිසි ප්‍රසම්පාදන වැඩසටහනක් සකස් කිරීම,— ග්‍රාමීය ජනතාවට ඉතාම සමීප ව්‍යාපාරයක් වූ සමුපකාර ව්‍යාපාරය මේ වනවිට විවිධ ගැටලුවලට මුහුණ දී තිබෙන හෙයින් සමුපකාර සමිති සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාවලියට රජය විසින් නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සහ බෙදා හැරීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉහළ නැංවීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඖෂධ හා වෙනත් ද්‍රව්‍ය ආනයනය කිරීමේ ක්‍රියාවලිය පුද්ගලයන් කිහිපදෙනෙකු අත රඳා පැවතීම නිසා ජනතාවට විවිධ අසීරුතාවයන්ට මුහුණදීමට සිදුවී තිබෙන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉහළ නැංවීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/2024

ගරු රෝහණ බංඩාර මහතා,— රජය සතුව සහල් සංචිතයක් පවත්වාගෙන යාම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම,— වර්තමානයේ ශ්‍රී ලංකාවේ සහල් වෙළඳපොළ පෞද්ගලික ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකුගේ ග්‍රහණයට නතුව තිබෙන හෙයින් වෙළඳපොළ තුළ සහල් මිල පාලනය කිරීම සඳහා රජය සතුව සහල් සංචිතයක් පවත්වාගෙන යාමට රජය විසින් සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය නිසි අධීක්ෂණයකට ලක් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට ඉතාම සමීප සමුපකාර ග්‍රාමීය බැංකු රැසක් පසුගිය කාලයේ දී විවිධ හේතු මත බිඳ වැටීමෙන් එහි තැන්පත්කරුවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දී සිටින හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා එම බැංකු රජය විසින් නිසි අධීක්ෂණයකට ලක් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු සුබසාධන නිලධාරින් පත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සුවිශාල දායකත්වයක් ලබා දෙන විදේශගත ශ්‍රමිකයන්ගේ සුබසාධන කටයුතු සම්බන්ධව වගකීම් දරන කම්කරු සුබසාධන නිලධාරින් පත් කිරීමේ දී මෙතෙක් නිසි ක්‍රමවේද අනුගමනය නොකිරීම හේතුවෙන් ගැටලු රාශියක් මතු වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා රජය විසින් නිසි ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් තරඟ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල රාමුවෙන් බැහැරව, රැකියා වෙළඳපොළ හා වෘත්තීය තාක්ෂණය ඉලක්ක කොටගත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාඨමාලා පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— විගණන වාර්තා මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— රජයේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල සිදුවන විවිධ මූල්‍යමය වංචා පිළිබඳව විගණන වාර්තා මඟින් කරුණු හෙළි කරන හෙයින්, එවැනි වංචා හා දූෂණ රාජ්‍ය ආයතනවල සිදුවීම වැළැක්වීම සඳහා එම වාර්තා මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමඟින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ දැමීම,— ශ්‍රී ලංකාවේ ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය අහෝසි කිරීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තම නිල කාලය අවසන් වූ පසුව විශ්‍රාම වැටුප් ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයින් විරුද්ධත්වයක් දක්වන බව ඉතා පැහැදිලිව පෙනෙන හෙයින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම ජීවත්වීමට නිවසක් ලබා දීම,— ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම ජීවත් වීමට නිවසක් හිමි විය යුතු වන බැවින්, සෑම ගෘහමූලිකයෙකු හටම තම ආරක්ෂාව සහ යහ පැවැත්ම උදෙසා නිවසක් මිලදී ගැනීම, ඉදිකිරීම හෝ කුලියට ගැනීම සඳහා සවිබල ගන්වමින් ඔහු හෝ ඇය හට පහසුකම් සැලැස්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/2024

ගරු රවී කරුණානායක මහතා,— සෑම තරුණයෙකුම ඵලදායි රැකියාවක නියුතු පුද්ගලයෙකු හෝ ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත් කිරීම,— වයස අවුරුදු 18 සම්පූර්ණ කරන සෑම තරුණයෙකුටම ඵලදායි රැකියාවක නියැලීමේ අයිතිය තිබිය යුතු අතර, රැකියාවක නිරත නොවන්නේ නම්, ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත්වීම සඳහා මූල්‍ය ආධාර ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— කොවිඩ්-19 වසංගතයෙන් මිය ගිය පුද්ගලයින්ගේ සිරුරු මිහිදන් කිරීමෙන් වැළකී ආදාහනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කොට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මිය ගිය පුද්ගලයින්ගේ සිරුරු භූමදානය කිරීමේ හැකියාව පවතින බවට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් උපදෙස් නිකුත් කරනු ලැබ තිබියදී එම මළ සිරුරු භූමදානය කිරීමෙන් භූගත ජලයට වෛරසය මුසු වීමේ අවදානමක් පවතින බවට 2020 දී ආණ්ඩුව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය මත පදනම්ව එම මළ සිරුරු ඥාතීන්ගේ එකඟතාවයකින් තොරව ආදාහනය කළ හෙයින් ද, පසුව, එසේ ගනු ලැබූ තීරණය මත ක්‍රියාත්මකවීම නිවැරදි නොවූ බව සඳහන් කරමින් රජය විසින් නිල වශයෙන් සමාව අයැදීම සිදු කළ හෙයින් ද, මෙම වසංගතයෙන් මිය ගිය තැනැත්තන්ගේ ඥාතීන්ට සිය ආගමානුකූලව අවසන් කටයුතු සිදු කිරීමට හෝ එම සිරුරු දැක බලා ගැනීමට හෝ අවස්ථාව අහිමි වූ හෙයින් ද, මේ සම්බන්ධයෙන් දේශීය හා අන්තර්ජාතික මට්ටමින් ගොඩනැගුණු විරෝධතා සහ බලපෑම් හේතුවෙන් ආදාහනය කිරීම වෙනුවට මඩකලපුවේ ඔඩ්ඩමාවඩි, මජ්මා නගර් නම් හුදෙකලා ප්‍රදේශයේ එම සිරුරු භූමදානය කළ හෙයින් මිය ගිය තැනැත්තන් වෙනුවෙන් ඉටු කළ යුතුව තිබූ ආගමානුකූල චාරිත්‍ර සහ අවසන් ගෞරව දැක්වීමේ අයිතිය ඥාතීන්ට අහිමි වූ හෙයින් ද, මිය ගිය තැනැත්තන්ගේ පවුලේ සාමාජිකයන් හා සමීපතම ඥාතීන්ට සාධාරණය ඉෂ්ට කිරීමේ අවශ්‍යතාවය සහ මහජන ඉල්ලීම් සැලකිල්ලට ගෙන රජයේ පාර්ශ්වයෙන් සිදු වූ ඉහත සඳහන් බරපතල වැරදි විමර්ශනය කොට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.